සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය

වර්ෂ අවසාන පරීක්ෂණය - 2019

14 S I

# කතෝලික ධර්මය - I

කාලය පැය එකයි

සැලකිය යුතුයි :- ● සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
● අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
● ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
● එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද කියවා ඒවාද පිළිපදින්න.

01. ශුද්ධ පාවුළුතුමාගේ හසුන් වර්ගීකරණය අනුව ශුද්ධ පාවුළුතුමා විසින් ම ලියන ලද සංදේශය ගණන වනුයේ,
1. 21 කි. 2. 13 කි. 3. 7 කි. 4. 4 කි.

02. ආරූඪ නාමයකින් ඉදිරිපත් කර ඇති එළිදරව්ව ග්‍රන්ථයේ කර්තෘ ලෙස පිළිගනු ලබන්නේ,
1. ශුද්ධ වූ පේදුරු තුමා 2. ශුද්ධ වූ පාවුළු තුමා
3. ශුද්ධ වූ ජාකොබ්තුමා 4. ශුද්ධ වූ ජොහාන්තුමා

03. පීඩාකාරී බලය නියත ලෙස පරාජයට පත් වී ඇදහිලිවන්තයින් උදෙසා සෞභාග්‍යවත් කාලයක් උදා වන බව දක්වන එළිදරව්ව සාහිත්‍යය ලක්ෂණය වනුයේ,
1. ද්විත්වවාදය 2. යුගාන්තවාදය 3. සංකේත භාවිතය 4. ආරූඪ කර්තෘත්වය

04. පරිපාලන ක්ෂේත්‍රයන් ඉලක්ක කොට ගෙන යෞවනන් පුහුණු කිරීම සඳහා ලියවුණු ප්‍රඥා සාහිත්‍යය ග්‍රන්ථයකි.
1. ජෝබ් 2. ධර්මදේශකයා 3. සලමොන්ගේ ප්‍රඥාව 4. සිරාක්

05. A- පියාණනි , ඔවුන්ට කමා වුව මැනව, ඔවුන් කරන දෙය ඔවුන් නොදනිත.
B- පියාණනි මේ දුක් පාත්‍රය මාගෙන් ඉවත් කළ මැනව. එහෙත් එය මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා.
C- ඇත්තෙන්ම මම ඔබට කියමි. ඔබ මා සමඟ අදම පාරාදීසයෙහි සිටින්නෙහිය.
D - පියාණනි ඔබගේ හස්තයට මාගේ ආත්මය භාර දෙමි.
E - මනුෂ්‍ය පුත්‍රයාණන් බල පරාක්‍රමයාණන්ගේ දකුණු පස වැඩ සිටිනවාත් අහසේ වලාකුළු පිරිවරා වැඩ හිඳිනවාත් ඔබ හැම දකිනු ඇත.

**ඉහත ප්‍රකාශ අතුරින් ජේසුස් වහන්සේ කුරුස ගසේ සිටිය දී ප්‍රකාශ කළ වාක්‍ය පමණක් ඇතුළත් වරණය වනුයේ,**
1. B, C, D 2. B, C, E 3. A,C,D 4. A,D,E

06. පෙන්තකොස්ත දින ශුද්ධාත්මයාණන්ගේ පූර්ණ වූ ශුද්ධ පේදුරුතුමා තම ප්‍රථම දේශනය පවත්වන ලද්දේ,
1. පිලිප්පි කයිසාරියේ දි 2. නාසරෙත් ධර්මශාලාවේ දී
3. සේනාකුළු ශාලාවේ දි 4. ජෙරුසෙලම් චතුරස්‍රයේ දී

07. ශුද්ධ වූ පාවුළු තුමාගේ දෙවන ධර්මදූත ගමනට සහභාගී වූ සහයකයෙක් වනුයේ,
1. බර්ණබස් තුමා 2. ජොහාන් මාක් තුමා
3. තිමෝතියස් තුමා 4. ඔනෝසිමස් තුමා

08.ශුද්ධ වූ සභාව තම විශ්වීය බව හෙවත් කතෝගිකත්වය ව්‍යාප්ත කරනුයේ,
1. ධර්මදානය තුළිනි. 2. දේව මැවිල්ල තුළින් ය.
3. පව් සමාව තුළිනි. 4. ප්‍රේමයේ පණිත තුළිනි.

09. "යම් පමණ වර ඔබ මෙයින් පානය කරන්නාහු ද එපමණ වර මා සිහි කිරීම පිණිස මෙය කරන්න". මෙලෙස දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ගිවිසුමක් බව දක්වන ග්‍රන්ථය වනුයේ,
1. ශුද්ධ ජොහාන් 2. ශුද්ධවූ ලූක් 3. I කොරෙන්ති 4. කොලොස්සි

10. දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට සහභාගී වන්නන් ප්‍රේමයේ පණිත ජීවත් කළ යුතු බව දක්වන සිදුවීමකි.
1. අන්තිම රාත්‍රී භෝජනය 2. බෙතානියේ දී ආලේප කිරීම.
3. පාද දෝවනය 4. උත්තම පූජක යැදුම.

11. දිව්‍ය පූජාවේ දී " ලේ වැගිරීමකින් තොර ව" අල්තාරය මත සක්‍රමේන්තු ආකාරයට අප සමරන්නේ ලබන්නේ,
1. කල්වාරි යාගයය.
2. පේදුරුගේ අපලාපයයි
3. ක්‍රිස්තුස් වහන්සේ කුරුසයේ උකුත් වීමය.
4. ක්‍රිස්තුස් වහන්සේගේ ස්වර්ගාරෝහනයයි

12. මෑත කාලීන ශ්‍රී ලාංකිය කිතුණු සභාවට මහත් මෙහෙරවක් කළ ගරු මයිකල් රුදිගෝ පියතුමන් අයත් පැවිදි නිකාය වනුයේ,
1. සිල්වෙස්ත්‍ර බෙනදිකාන නිකාය
2. නිමල මරිය නිකාය
3. ප්‍රැන්සිස්කාන නිකාය
4. දිව්‍ය සත්ප්‍රසාද නිකාය

13. "මම පූජා වලට වඩා කරුණාවට කැමැත්තෙමි. දවන යාග පූජා වලට වඩා දෙවියන් පිළිබඳ අවබෝධයට කැමැත්තෙමි." යාග ඔප්පු කිරීම සම්බන්ධව මෙලෙස දක්වන දිවැසිවරයා වනුයේ,
1. මලාකි
2. සෙකරියා
3. ආමෝස්
4. හොසියා

14. එක්වරු ශීලය හා ගොඩ මස් කෑමෙන් වැළකීම පිළිබඳ වූ සභා ශික්ෂා පදය රැකීම සම්බන්ධ දේව පනත වනුයේ,
1. සැබෑ වූ එකම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කරව
2. දෙවියන්ගේ ශ්‍රී නාමය බොරුවටත් නිරන්තරයටත් නොදිව්රව
3. ඉරු දිනක් ණය මංගල්‍ය දිනත් නිවාඩු වලංගු කරව.
4. ජීවිත විනාශ නොකරව.

15. " මා නුඹ කුසෙහි පිළිසිඳගැනීම ඇති කරන්නටත් පෙර මමත් මම නුඹ හඳුනා ගතිමි.නුඹේ උපතට පෙර මම නුඹ කැප කළෙමි." මෙලෙස තම දේව කැඳවීම ලැබූ දිවැසිවරයා වනුයේ,
1. යෙසායා
2. ජෙරමියා
3. එසකියෙල්
4. ආමෝස්

16. ශුද්ධ පාවුළු තුමා I කොරෙන්ති ලිපියෙන් දන්වා යවන ලෙස මිනිසා තමාගේම ශරීරයට විරුද්ධව කරන පාපය වනුයේ,
1. අනාචාරය
2. ගබ්සාව
3. සියදිවි නසා ගැනීම
4. බේබදුකම

17. ඉරු දින කියවනු ලබන සුභාරංචිය සඳහා ශුද්ධ ජොහාන් සුභාරංචිය යොදා ගන්නා ජනවන්දනා වර්ෂයේ කාල පරිච්ඡේද 2 වනුයේ,
1. ආගමන සමය හා නත්තල් සමය
2. නත්තල් සමය හා සාමාන්‍ය සමය
3. සාමාන්‍ය සමය හා වතාරික සමය
4. වතාරික සමය හා පාස්කු සමය

18. නත්තල් සමය තුළ දෙසැම්බර් 25 න් පසුව එන ඉරිදා දින දී අප සමරනු ලබන මංගල්‍යය වනුයේ.
1. පාරිශුද්ධ දේව මාතා මංගල්‍යය
2. දිව්‍ය බිළිඳාණන් රජුන්ට ප්‍රත්‍යක්ෂ වීමේ මංගල්‍යය
3. නිදොස් බිළිඳුන්ගේ මංලගල්‍යය
4. ශුද්ධ වූ පවුලේ මංගල්‍යය

19. ශුද්ධාත්ම මංගල්‍යය, ගොබ් ඉරුදින හෝ මහ සිකුරාදා දිනයන්හි භාවිතා කරනු ලබන ජනවන්දනා වර්ණය වනුයේ,
1. සුදු
2. රතු
3. කොළ
4. දම්

20. කිතුණු ජන වන්දනා ඉගැන්වීම අනුව දිව්‍ය පූජාවක් ආරම්භ වනුයේ,
1. හැඳින්වීමෙනි
2. පූජාසනය සිපාචාර කිරීමෙනි
3. ඇතුළුවීමේ ගීතිකාවෙනි
4. සුවඳ දුම් ඇල්ලීමෙනි

21. ඊශ්‍රායෙල් ජනතාවගේ දේව අත්දැකීම් වලින් පිරුණු , කාන්තාරයේ දුෂ්කර ගමන පිළිබඳව ලියවී ඇති පංච පුස්තකයේ ග්‍රන්ථය වනුයේ,
1. උත්පත්ති
2. නික්මයාම
3. ලෙවි ව්‍යවස්ථාව
4. ගණන් කතාව

22. ප්‍රොතෙස්තන්ත්‍ර වරුන්ට අනුව පුරාණ ගිවිසුමේ සම්මත ග්‍රන්ථ ගණන වනුයේ,
1. 27 කි
2. 39 කි
3. 46 කි
4. 66 කි

23. දේශක දිවැසිවරුන් නමින් පුරාණ ගිවිසුමේ ග්‍රන්ථ නොමැති අතර, ඔවුන්ගේ වචන හා ක්‍රියා සඳහන් ග්‍රන්ථයකි.
1. වීරාවලිය
2. වංශාවලිය
3. රාජාවලිය
4. ගීතාවලිය

24. කැඳවීමට පෙර අයකැමියෙකු වූ මතෙව් අපෝසතළුතුමන්ගේ පියාගේ නාමය වනුයේ,
1. සෙබදි
2. අල්පෙවුස්
3. තද්දේවුස්
4. බර්තොලමෙවුස්

25. උත්පත්ති පොතේ 1-11 දක්වා ප්‍රාග් ඉතිහාසය ලෙස හැඳින්වේ.
**A** උත්පත්ති පොතේ 1 - 11 දක්වා ප්‍රාග් ඉතිහාසය ලෙස දැක්වේ.
**B** ප්‍රාග් ඉතිහාසය ඉදිරිපත් කරන බයිබල් කතුවරයාගේ අරමුණ විශ්විය හා මිනිසා ඇති වූ ආකාරය ඉගැන්වීමය.
**C** ප්‍රාග් ඉතිහාසයෙන් උගත හැක්කේ ඓතිහාසික විද්‍යාත්මක හා දේව ධාර්මික කරුණුය.

D ප්‍රාග් ඉතිහාසයේ මැවීම පිළිබඳ කතා පුවත් 2 ක් අඩංගු වේ.
E ප්‍රාග් ඉතිහාසය ලෝකය මැවීමට අනුව මිනිසා අන් මැවිලි වලට වඩා උසස්ය.
ඉහත ප්‍රකාශන අතුරින් නිවැරදි කරුණු පමණක් ඇතුළත් වරණය වනුයේ,
1. A, B, හා D 2. B,C, හා D 3. A, D, හා E 4. C, D, හා E

26. මෙලොව පාපය වඩ වඩාත් වර්ධනය වීම හේතුවෙන් මැවිල්ල අලුත් කිරීමට සිතු දෙවියන් වහන්සේ නව මැවිල්ලේ ආරම්භයකයා ලෙස
තෝරා ගන්නා ලද්දේ,
1. ආදම් 2. ආබ්‍රහම් 3. නෝවා 4. ජාකොබ්

27. " මෝසෙස් මඟින් ඊශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශය කරා ගෙන ගිය දෙවියන් වහන්සේ .................................... මඟින් අප ........................................... නැමති පොරොන්දු දේශයට ගෙන එන සේක. මෙහි හිස්තැන් සඳහා සුදුසු පිළිතුර වනුයේ,
1. පාපොච්චාරණය, පව් සමාව 2. බෞතීස්මය, දේව රාජ්‍යය
3. දේව රාජ්‍යය, දේවානුභාවය 4. බෞතීස්මය, ප්‍රේමය

28. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ ඇති කරගත් ගිවිසුම ඉදිරිපත් කරන දේව ධාර්මික සම්ප්‍රදායන් 2 වනුයේ,
1. J හා E 2. E හා D 3. D හා P 4. P හා J

29. දෙවියන් වහන්සේට කළ නොහැකි දෙයක් නැති බව ඉස්මතු කරමින් දේව භක්තිය හේතුවෙන් මහලු වීමේ දී දරු සම්පත් හේතුවන ලැබූ යුවල වන්නේ,
1. ආබ්‍රහම්, සාරා 2. ඊසාක්, රෙබේකා
3. සෙකරියස් , එලිසබෙත් 4. දාවිත්, බෙත්ශෙබා

30. ශ්‍රාවකයින් හැත්තෑ දෙනාගේ ධර්මදූත මෙහෙය පිළිබඳව සඳහන් කරන එකම සුභාරංචි කතුවරයා වන්නේ,
1. ශුද්ධ වූ මාක් තුමා 2. ශුද්ධ වූ මතෙව් තුමා
3. ශුද්ධ වූ ලූක් තුමා 4. ශුද්ධ වූ ජොහාන් තුමා

31. ස්වර්ග රාජ්‍යයට ඇතුළු වීමට අප ප්‍රසාද ස්නාපනය ලැබිය යුතු බව ජේසුස් වහන්සේ ප්‍රකාශ කරනු ලැබුවේ,
1. බර්ණබස්ට 2. නිකදේමුස්ට 3. සාකේවුස්ට 4. ගමාලියෙල්ට

32. ජේසුස් වහන්සේගේ සලුවට අත ගැසූ ස්ත්‍රියට සුවය දානය කරමින් උන්වහන්සේ වදාළ වදන් වනුයේ,
1. ඔබේ පව් ඔබට කමා කළේය. 2. ඔබේ ඇදහිල්ල ඔබ සුවපත් කළේය.
3. ගැළවීම අප මේ ගෙදරට පැමිණ ඇත. 4. ඔබ ගොස් පූජකයන් ඉදිරියේ පෙනී සිටින්න.

33. "කිතුණු විවාහයක් දික්කසාද කළ නොහැක" මෙයට අදාළ කිතුණු විවාහයේ ප්‍රධාන ලක්ෂණය වනුයේ,
1. ඒකත්වය 2. අඛණ්ඩත්වය 3. ප්‍රේමය 4. දරුවන් ජනනය

34. තාපස ජීවිතය පිළිබඳ අධ්‍යයනයේ දී ආරණ්‍යවාසී තාපස දිවියේ පුරෝගාමියා ලෙස හඳුනාගන්නේ,
1. ඊජිප්තුවේ ශුද්ධ වූ අන්තෝනි තුමාය 2. තීබිස් හි ශුද්ධ වූ පාවුළුතුමාය
3. ශුද්ධ පාකෝමියස් තුමා 4. ශුද්ධ වූ බෙනඩික් තුමා

35. තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරයේ ආධ්‍යාත්මික පියවර 3 වන්නේ,
1. බැලීම, විග්‍රහය, ක්‍රියාව 2. තෝරා ගැනීම, ක්‍රියාව, සේවය
3. තෝරා ගැනීම, විමසීම, සේවය 4. සේවය, අගය කිරීම, පවත්වාගෙන යාම

36. " දීමෙන් අපට ලැබීමත්, සමාව දීමෙන් සමාව ලැබීමත්, මරණයෙන් අපට සදා ජීවිතයක් අත් වන බැවින් සාමය පතා දෙව්ඳු යදින්නට අපට උගන්වන ලද්දේ,
1. ශුද්ධ වූ අගොස්තිනු මුනිතුමා 2. අසීසියේ වූ ශුද්ධ ප්‍රැන්සිස් මුනිතුමා
3. ශුද්ධ වූ ජෝන් ක්‍රිසෝස්තම් තුමා 4. ශුද්ධ වූ ග්‍රෙගරි තුමා

37. ශුද්ධ වූ සභා ශික්ෂා පදයක් වන එක්වරු ශීලය රැකීමේ ප්‍රධාන පරමාර්ථය වනුයේ,
1. කුසගින්න දරා ගැනීමට හුරුකරවීම. 2. කුසගිනි අයට දන්දීමට හුරු කිරීම.
3. සභා ඉගැන්වීම් වලට ගරු කිරීම. 4. ලෞකික දේ අපට අනවශ්‍ය බව පසක් කිරීම.

38. ස්වාමිවක් ආරාධනාව ඇසුරින් සැකසුනු "ත්‍රී එක සුර ජේසුනි " ගීතාකාව රචනා කරන ලද්දේ
1. ශුද්ධවූ ජුසේවාස් පියතුමා 2. භාග්‍යවත් ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා
3. ගරු මයිකල් රුද්‍රිගෝ පියතුමා 4. ගරු මර්සිලින් ජයකොඩි පියතුමා

39. ක්‍රි.ව. 1858 පෙබරවාරි මස ප්‍රංශයේ ලූර්දු නුවරදී දේව මාතාවන් දර්ශනය වීමේ වරප්‍රසාදය ලද්දේ,
1. ප්‍රැන්සිස්කෝ 2. ජසින්තා 3. ලුසී 4. බර්ණදෙත්

40. උදා යාම යැදුම සඳහා භාවිතා වන ප්‍රශංසා ගීතය වනුයේ,
1. සෙකරියස් තුමාගේ ප්‍රශංසා ගීතය 2. සිමියොන් තුමාගේ ප්‍රශංසා ගීතය
3. මරිය තුමියගේ උදාන ගීතය 4. දේව දූතයන්ගේ ප්‍රශංසා ගීතය

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
**Department of Education Central Province**

| 11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 14 S II |
|---|---|---|

| කතෝලික ධර්මය - II | කාලය පැය එකයි |
|---|---|

සැලකිය යුතුයි :- ● පළමු වැනි ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
● පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමිවේ.

(01) i. කතුවරයාගේ ආරක්ෂාව සැලසීම පිණිස වෙනත් නාමයකින් ඉදිරිපත් කර ඇති බයිබල් ග්‍රන්ථ 2 ක් ලියන්න.
- ii. ශ්‍රී ලංකාවට සේවය කිරීම සඳහා ධර්මදූතවරු එවන ලෙස පෘතුග්‍රීසීන්ගෙන් ඉල්ලූ රජතුමා හා ඔහුගේ රාජධානිය ලියන්න.
- iii. ශුද්ධ වූ මැක්ෂිමිලියන් කෝල්බේ පියතුමාට දර්ශනය වූ දේව මාතාවගේ දෑතෙහි වූ රතු හා සුදු ඔටුනු දෙකෙහි අර්ථයන් 2 ක් ලියන්න.
- iv. "ස්වාමීන්ගේ ආත්මයාණන් පරීක්ෂා කරන්නට ඔබ දෙපළ එකඟ වූයේ කෙසේ ද? " පේදුරු තුමා විසින් විමසන ලද මෙහි "ඔබ දෙපළ" ලෙස දක්වන්නේ කවුරුන්ද?
- v. දිව්‍ය පූජාවේ දේව වාක්‍ය පිළිවෙතෙහි පළමු කොටස් 2 ලියන්න.
- vi. සෙබදි හා ශලෝමිගේ පුත්‍රයින් දෙදෙනා නම් කරන්න.
- vii. ශුද්ධ වූ සභා මාතාව විසින් නම් කර ඇති ජනවන්දනා සමයේ මනස්ථාප කාල 2 ලියන්න.
- viii. ගිහි දූත සේවය පිළිබඳ උගන්වනු ලබන විශ්ව සභා ලේඛන 2 ක් නම් කරන්න.
- ix. මැවීම පිළිබඳ දෙවන කතාවට අනුව මිනිසාට පැවරෙන වගකීම් 2 ක් නම් කරන්න.
- x. ශුද්ධ වූ සභා ශික්ෂා පද රැකීම තුළ තහවුරු කරන දේව ප්‍රසාද නිධාන 2 නම් කරන්න.

(02) i. මුල් කිතුණු සභාවේ ලක්ෂණ 02 ක් ලියන්න.
- ii. උපස්ථායකයින් තෝරා ගැනීමේ දී සළකා බැලූ ප්‍රධාන ගුණාංග 3 ලියන්න.
- iii. අභිවෘද්ධි ආලේපය තුළ ශුද්ධාත්ම බලය ලැබූ ඔබට කිතුණු විශ්වාස වෙනුවෙන් සාක්ෂි දැරිය හැකි අවස්ථා 5 ක් ලියන්න.

(03) i. " මා හැර අන් කිසි දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතුය" යන පණතට පදනම් වී ඇති දේව ධර්ම ගුණ 2 ක් ලියන්න.
- ii. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව දේව ප්‍රේමයට විරුද්ධ පාප 03 ක් ලියන්න.
- iii. ඉරු දින ශුද්ධවත්ව ගත කිරීම සඳහා ඔබට කළ හැකි දේවල් 3 ක් ලියන්න.

(04) i. සර්පයා ඒවට පවසන ලෙස උයනේ මැද ඇති ගසින් ගෙඩි කෑමෙන් අත්වන ඉරණම් තත්ත්ව 02 ලියන්න.
- ii. දෙවියන් වහන්සේ ඒවට දුන් දඬුවම් 3ක් ලියන්න.
- iii. නව යොවුන් වියේ පසුවන ඔබ රුචිකත්වයක් දක්වන අංග 05 ක් පහත දැක්වේ. ඒ එක් එක් අංගයෙහි යහපත් - අයහපත් ප්‍රතිඵල හෝ භාවිතා කළ යුතු අයුරු එක් කරුන බැගින් කරුණු 5 කින් විස්තර කරන්න.
  - A - පරිගණකය
  - B - අන්තර්ජාලය
  - C - ජංගම දුරකථනය
  - D - මුහුණු පොත
  - E - විලාසිතා

(05) i. ශ්‍රී ලංකාව තුළ අධ්‍යාපනය සඳහා කැපවන ප්‍රධාන පැවිදි නිකායන් 2 ක් ලියන්න. ( පැවිදි පූජක/ සහෝදර/ පැවිදි සොයුරියන් අදාළ වේ.)
- ii. කතෝලික දහම් පාසලක් තුළ සිදුකරන ප්‍රධාන සේවා 03 ක් ලියන්න.
- iii. පොදු පූජකවරයෙන් ඔබට ලැබෙන දූත සේවා දියත් කිරීමට මීසමේ සමිති සමාගම් වලට සම්බන්ධ වී ඔබ ඉටු කරන කාර්යයන් කරුණු 5 කින් විස්තර කරන්න.

(06) i. ශුද්ධ සභා පණත් තුළින් එක්වරු ශීලය රැකීමට නියම වන දින 2 ක් නම් කරන්න.
- ii. ආත්මික පුණ්‍ය ක්‍රියා 3 ක් නම් කරන්න.
- iii. මරිය බැතිය හා මරිය තුමියට අප ගෞරව කිරීමට හේතු 5 ක් ඇසුරින් පුවත්පතකට ලිපියක් ලියන්න. (වචන 150 කට නොවැඩි)

(07) පහත මාතෘකා අතුරෙන් 2 ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
- i. ලන්චියානෝ නුවර ප්‍රාතිහාර්යය
- ii. පස්වන පණත හා ඊට විරුද්ධ ක්‍රියා
- iii. වතාරික සමය
- iv. එසකියෙල්ගේ කැඳවීම
- v. යාම යැදුමේ ආරම්භය හා විකාශනය

# වර්ෂ අවසාන පරීක්ෂණය - 2019
## කතෝලික ධර්මය

11 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය
## I කොටස

| | | | |
|---|---|---|---|
| 01 - 3 | 11 - 1 | 21 - 4 | 31 - 2 |
| 02 - 4 | 12 - 2 | 22 - 2 | 32 - 2 |
| 03 - 2 | 13 - 4 | 23 - 3 | 33 - 2 |
| 04 - 3 | 14 - 3 | 24 - 2 | 34 - 2 |
| 05 - 3 | 15 - 2 | 25 - 3 | 35 - 1 |
| 06 - 4 | 16 - 1 | 26 - 3 | 36 - 2 |
| 07 - 3 | 17 - 4 | 27 - 2 | 37 - 2 |
| 08 - 1 | 18 - 4 | 28 - 4 | 38 - 2 |
| 09 - 3 | 19 - 2 | 29 - 3 | 39 - 4 |
| 10 - 3 | 20 - 3 | 30 - 3 | 40 - 1 |

## II කොටස

(01) i. දානියෙල් , එලිදරව්ව
ii. 7 වන බුවෙනකබාහු - කෝට්ටේ රාජධානිය
iii. ව්‍රෘත ශුද්ධිය, ප්‍රාණ පරිත්‍යාගී ජීවිතය
iv. අනනියස්, සපීරා
v. පළමුවන දේව ප්‍රකාශනය, පිළිතුරු ගීය
vi. ජාකොබ්, ජොහාන්
vii. ආගමන කාලය, චතාරික කාලය
viii. කතෝලික සභා ධර්මෝපදේශය
ජාතීන්ගේ ආලෝකය
ix. වගා කිරීම (ආබාද්) රැකබලා ගැනීම (ෂාමාර්)
x. දිව්‍ය සත් ප්‍රසාදය , පාපොච්චාරණය

(02)i.ඉගැන්වීම/ රොටී කැඩීම/ සහභාගීකම / යාච්ඤාව
ii.- යහපත් දිවි පෙවතක් ගත කිරීම.
- ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීම.
- ප්‍රඥාවෙන් පූර්ණ වීම.
iii.- දිව්‍ය පූජාවට භක්තිකයෙක් සහභාගී වීම
- ශුද්ධ බයිබලය අනුසාර කරමින් ආදර්ශමත් දිවියක් ගත කිරීම.
- දේව වචනය නොදන්නා අයට කියාදීම.
- තම යුතුකම් වගකීම් ඉටු කිරීම.
- තම ප්‍රසාද ස්නාපන කැඳවීම ඉටු කිරීම.

(03) i. විශ්වාසය, බලාපොරොත්තුව , ප්‍රේමය
ii. - දේව ආදරය පිළිබඳ මෙනෙහි නොකිරීම.
- දේව ප්‍රේමයට ප්‍රතිචාර නොදැක්වීම.
- දිව්‍යමය වූ යහපතින් කෙනෙකු වළක්වාලීම.
- උඩඟුවෙන් දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කිරීම

iii.(10-73)
- දිව්‍ය පූජාවට නිසි සූදානමකින් යුතුව භක්තියෙන් සහභාගී වීම.
- වෙනත් දිනයන්ට වඩා යාච්ඤා කිරීම.
- රොගීන් බලන්නට යාම.
- ශුද්ධ ලියවිල්ල කියවීම.
- දෙමාපියන්ට හා අන් අයට සහය වීම.
- විවිධ සමිති සමාගම් වලට සහය වීම.
- පවුලතුළ එකමුතුව වැඩ කිරීම.

(04) i. - ඇස් පෑදීම
- දෙවියන් හා සමාන වීම.
- හොඳ නරක අවබෝධ වීම.
ii - නුඹේ ගැබ් ගැනීමේ වේදනා බොහෝ සේ වැඩි කරන්නෙමි.
- විළි රුදා ඇතිව නුඹ දරුවන් ප්‍රසූත කරන්නෙහිය.
- සැමියාට ආදරය කළ ද ඔහු ඇයව පාලනය කරන්නේය.
iii. සිසුන් ලියා ඇති කරුණු සලකා බලා ලකුණු දෙන්න.

A - පරිගණකය - දැනුම දියුණු කරගැනීම
- නව තොරතුරු සොයා ගැනීම

B - අන්තර්ජාලය - විශ්ව ලෝකය හා සම්බන්ධ වීම
- සියල්ල ක්ෂණිකව දැන යාවත්කාලීන වීම

C - ජංගම දුරකථනය - යහපත් මානව සබඳතා පවත්වාගෙන යාම.

D - මුහුණු පොත - නව යහපත් මිතුරන් මුණ ගැසීම
- තොරතුරු හුවමාරුව

E - විලාසිතා - මා පිය ආර්ථිකය තුළ ගැළපෙන උචිත දෑ තෝරා ගැනීම.

(05) i. නිමල මරිය නිකාය, සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකාය, මාරිස්ට් සහෝදරතුමන්ලා, දයාවේ සහෝදරතුමන්ලා, ශාන්ත ජෝන් බැප්ටිස්ට් ද ලාසල් නිකාය, ශුද්ධ වූ පවුලේ නිකාය, යහපත් එඬේරාගේ නිකාය, සුරදූත පැවිදි
නිකාය, දයාවේ සොයුරියෝ

ii. - ස්වෙච්ඡාවෙන් දරු දූරියන්ට ධර්මය ඉගැන්වීම.
- ළමා දින පැවැත්වීම.
- බයිබල් දැනුම මිනුම තරග පැවැත්වීම.
- සෑම වසරක් අවසානයේ දීම දහම් පාසල් පරීක්ෂණයක් පැවැත්වීම.
- දහම් ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම.
- ජාතික දහම් ගුරු විභාග සඳහා දහම් ගුරුවරුන් සූදානම් කිරීම.

iii. - සතිපතා දහම් පාසල් යාම.
- දහම් පාසල් තරඟ, ක්‍රියාකාරකම් හෝ පරීක්ෂණ සඳහා මනා සූදානමකින් යුතුව සම්බන්ධ වීම.
- මරිය හමුදාව මඟින් ආරෝග්‍යශාලා වල රෝගීන් බැහැදැකීම.
- අසරණ අයගේ නිවෙස් බැහැදැකීම, අවශ්‍යතා සොයා බැලීම හා ඉටු කිරීම.
- ජපමාලය හා දේව මාතා භක්තිය වර්ධනය කර ගැනීම.
- දිව්‍ය හෘදයේ සමිතිය මඟින් ශුද්ධ පැය කිරීමට උනන්දු වීම.
- මසකට වරක් හෝ පාපොච්චාරණය කිරීම.
- තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය මඟින් දේව රාජ්‍යයේ වටිනාකමින් හෙබි කිතුණුවෙකු බිහි කිරීම.
- සාන්ත වින්සන්ද පාවුළු සමිතිය මඟින් මහලු නිවාස/ ළදරු පාසල් සඳහා සහය වීම.
ආදී කරුණු ඇත්නම් ලකුණු දෙන්න.

(06) i. අළු බදාදා, මහ සිකුරාදා, අවුරුද්දේ සෑම සිකුරාදා

ii. පව්කරුවන් පාපයෙන් ගලවා ගැනීම/ අඥානයන්ට ඉගැන්වීම/ සැක ඇති අයට දැනමුතුකම් දීම/ දුකින් පෙළෙන්නන් සැනසීම/ නින්දා අපහාස ඉවසීමෙන් දරා ගැනීම/ වැරදි කමා කිරීම/ ජීවතුන් හා මළවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම.

iii. 1. ගෞරව කිරීමට හේතු :-
- එතුමිය දේව පුත්‍රයාණන්ගේ මාතාව වීම.
- ජන්ම පාපයෙන් නිර්දෝෂව පිළිසිඳගැනීම.
- මවක් වුවත් දරු ප්‍රසූතියට පෙර හා පසු කන්‍යාභාවය ආරක්ෂා කිරීම.
- දේව වරප්‍රසාදයෙන් පූර්ණ වීම.
- සකළ පාපයෙන් නිදොස් වීම.
- ආත්ම ශරීර පිටින් සුරලොවට වැඩීම.

2. මරියතුමියගේ ස්වර්ගාරෝපණය
3. මරියතුමියගේ දර්ශනය වීම.
4. මරිය තුමියට ඔප්පු කරන සදාසරත නුවානය හා ජපමාලය
5. මරිය තුමියට ගෞරව කරමින් පවත්වන මංගල්‍යයන් ඇසුරින් කරුණු ඉදිරිපත් කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

(07) 1. පිටු අංක 10-47
2. පිටු අංක 10-84, 85
3. පිටු අංක 10-108,109
4. පිටු අංක 11 -11
5. පිටු අංක 11- 124